Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School



අවබෝධ ප්‍රශ්නය

(01) ප්‍රශ්නවලට අදාළ සියලුම පිළිතුරු ඡේදයේම සඳහන්ව ඇති බැවින් එම ඡේදය කීපවරක් හොඳින් කියවන්න.

* අනවශ්‍ය විස්තර ලිවීමෙන් වැලකී නිශ්චිත කෙටි පිළිතුර පමණක් ලියන්න.
* ප්‍රශ්න 5 ටම පිළිතුරු සපයන්න.

1) පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

චිත්‍ර කතා පාඨක පිරිස් වැඩි කර ගැනීම සඳහා අප සමාජයේ මෙතෙක් සම්භාවිත චර්යා ධර්මවලට පිටුපා සීමාව ඉක්මවා යනුද පෙනෙයි. දැන් දැන් ඇතැම් චිත්‍ර කතා පත්‍රවල අශෝභන චිත්‍ර පවා දක්නට ලැබේ. හැඟීම් කුපිත කිරීම විනා මෙබඳු චිත්‍ර කතාවලින් ඉටුවන අන් කාර්යයක් නොමැත. බොහෝ කතාවලින් පිළිඹිබු වන්නේ දුටු දුටුවන්ට ප්‍රේම කරන යෞවන යෞවනියන්ය. ආත්ම ගරුත්වය රැක ගනිමින් හැඟීම් පාලනය කරමින් සාර්ථක ජීවන මාර්ගයකට එළඹෙන අයවිරලය. මෙබඳු පුද්ගලයින්ගේ ක්‍රියා කලාපය පාඨකයන් තුළ ද වැරදි අදහස් පහළ කිරීමට බලපෑම් කළ හැකිය. කෙසේ වෙතත් ළමා පරපුර අතර බහුල ලෙස ප්‍රචලිත වී ඇති මෙම මාධ්‍යය විමර්ශනයට භාජනය කොට එහි අහිතකර තත්ත්වයන් මඟ හරවා ගැනීමට උගතුන් උත්සුක විය යුතු කාලය පැමිණ ඇතැයි සිතේ.

i. මෙහි දැක්වෙන ආකාරයට චිත්‍ර කතා පාඨක පිරිස් වැඩි කර ගැනීම සඳහා සම්භාවිත චර්යා ධර්මවලට පිටු පා යන අවස්ථාවක් දක්වන්න.
ii. අශෝභන චිත්‍ර කතාවලින් සිදු වන හානියක් දක්වන්න.
iii. සමාජයේ උගතුන් උත්සුක විය යුත්තේ කුමකට ද?
iv. විරල යන පදයේ විරුද්ධ පදය ඡේදයෙන් උපුටා දක්වන්න.
v. පහත සඳහන් යෙදුම්වල අර්ථය දක්වන්න.

පිළිඹිබු වීම -

උත්සුක වීම -